




**අලුත් පොත්**

# මගේ පුතා

## යෙලේනා කොෂෙවයා

රුසියානු බසින් පරිවර්තනය
**මල්රේණු කස්තුරිරත්න**

සිරිනි මල් පිපුණේ ය... සුදු පැහැ මල් පොකුරු විවෘත කවුළුව තුළින් මගේ කුටියට එබිකම් කරන්නට විය. 1926 ජුනි 08 වැනි දා ඒ මිහිරි ම මතකය. චෙර්නිගොව්ෂිනාවේ ප්‍රිලුකීහි දී මා සිතෙහි සිත්තම් විය. ඒ සොඳුරු දිනයේ මට පුතෙක් උපන්නේය.

ප්‍රිලුකී ප්‍රීතිමත් පිබිදුණු උක්‍රයින් නගරයකි. එය මනස්කාන්ත උදායි ගංගා නැම්මෙහි පිහිටි තිබෙයි. එම සුන්දර කුඩා ගං පොඩිත්ත සිතියම්හි දක්නට නැති වුව ද, එය මා සිතේ සදාකල් සුරැකි ව තැන්පත්ව ඇතිතේ ය.

කොතෙක් වාරයක් මා පුතු සමඟ ඒ මනරම් නදී තෙර,සේදවන් තණ පලස මත ඇවිදින්නට ඇති ද? නිදියේ එගොඩ මෙගොඩ ගමන් කළ සියවැක් අවස්ථා, ඒ සෑම විටෙක ම සුපැහැදිලි ව නිල්වන් නදී දිය තුළ නැරඹූ මසුන් ගේ දිය කෙළි, නිල්වන් පුළුල් තණ බිම මත ඇවිදිමින් වන මල් එකතු කළ සැටි, ඉන් මම් දම් ගොතා හිසවටා පැලඳූ සැටි...

මගේ පුතු උපන් ඒ අසිරිමත් දිනය, අද මෙන් මා මතකයෙහි ඇත. තුරුලතාවන්හි හරිතවන් පත්‍ර මත කාන්තිමත් හිරු රැස් සොම්නසින් දිදුලමින් තිබුණේ ය. ඒවායෙහි සෙවණැලි විටින් විට කුටියේ බිත්ති සහ සීලිම මත පෙනී නොපෙනී යයි. විහඟයෝ මහ හඬින් ගී ගැයුවෝ ය. ඉදින් මම මොහොතකටවත්, මගේ කුළුඳුල් පුංචි පුතු ගෙන් දෙනෙත් ඉවතට නොගත්තෙමි...

මගේ පුතු උපන් ඒ අසිරිමත් දිනය, අද මෙන් මා මතකයෙහි ඇත. තුරුලතාවන්හි හරිතවන් පත්‍ර මත කාන්තිමත් හිරු රැස් සොම්නසින් දිදුලමින් තිබුණේ ය. ඒවායෙහි සෙවණැලි විටින් විට කුටියේ බිත්ති සහ සීලිම මත පෙනී නොපෙනී යයි. විහඟ යෝ මහ හඬින් ගී ගැයුවෝ ය. ඉදින් මම මොහොතකටවත්, මගේ කුළුඳුල් පුංචි පුතු ගෙන් දෙනෙත් ඉවතට නොගත්තෙමි...

පුතකු ගේ ඉපැදීම මා කොතෙක් නම් ආසාවෙන් බලා සිටියා ද... එම පුතු දිගු සුමුදු කෙස් කලඹකින් යුත් ලස්සන පොඩිත්තකු වේවා යි සියවරක් පතන්නට ඇත්ද... යටත් පිරිසෙන් මුහුදු බෙල්ලන් පවා මම කල් ඇතිව සකස්කොට තැබුවෙමි...

පැතුම එලෙසින් ම ඉටු විය. ලස්සන පුංචි පුතෙක් මා ඉදිරියේ පෙනී සිටියේ ය... ඔහු ගේ ලොම් වැනි සිනිඳු දිගු හිසකෙි සිහින් හණ රෝදක් සිහිගැන්වී ය...

අපට පුතකු උපන්නොත් අලෙක්සේයි ලෙස ද, දුවක උපන්නෝත් ස්වෙත්ලානා ලෙස ද නම් තැබීමට සැමියාත් මමත් කල්තබා තීරණය කරගෙන සිටියෙමු. ඉදිත් උපන්නේ පුතෙකි. ඔහු ශ්‍රේෂ්ඨයෙක් ම විය.

'පුතාට තබන නම මොකක් ද?' යි මහලු වෛද්‍යවරයා විමසීය.

'අලෙක්සේයි' මම පිළිතුරු දුන්නෙමි.

'අපෝ එපා', යි වෙදැදුරා කවට ලෙස විරෝධය පැවේ ය. 'ඒ නම ගැළපෙන්නෙ නැහැ මේ වගේ නිරෝගී සැපවත් දරුවකුට යෝධයකු ගේ නමක් තියන්න ඕන'

අපේ ඉතිහාසයේ සෑම යෝධයකු ගේ ම නම් මම සිහිපත් කළෙමි. අන්තිමේ එක් නමක් ඉදිරියේ මා මනස නතර විය. ඔලෙග්. එම නම පියා ගේ ද සිත් ගත්තේ ය. එහෙත් ආත්තම්මාට සහ සීයාට නම් ඔහුගේ ඒ නමට හුරු වීමට කොහෙත් ම නුපුළුවන් විය.

ඔලේග් එය වැඩිහිටි මිනිසකු ගේ නමකැයි ඔවුන්ට හැඟුණේ ය. ඉදින්

ඔවුන් සිය අදාරණීය මොලකැටි මුනුබුරා කෙලෙස ඒ නමින් අමතන්න ද? ඔවුහු ඒ සඳහා නමක් සිතුවෝය.

'ඔලේෂෙක්'

ලස්සන නිරෝගිමත් පොඩිත්තකු ලෙස පුතා වැඩුණේ ය. 'කිසිම දවසක ඔහු මහ ර හැඬීමෙන් මා අවිදි කරවූ අවස්ථාවක් මා මතකයෙහි නෑ'. යි ඔලේග් ගේ සීයා ෆෙදොසි ඕසිපොවිච් කොෂෙවොයි" මෙලෙස කීවේ වරක් දෙවරක් නොවේ.

'මට දරුවන් දාහතර දෙනෙක් සිටියා. ඒත් මේ වගේ නිවිච්ච දරුවෙක් උපන් තේකට දැක නැහැ...'

පිටස්තර කෙනෙක් අප නිවෙසට පැමිණි විට, කුඩා දරුවෙක් නිවසේ සිටිතැයි කොහෙත් ම අනුමාන නොකළේය.

වසර අවසන් වන විට ඔලේග් ඇවිදින්නට පටන් ගත්තේ ය. ලෙඩ දුක් ආදියෙන් ඔහු අපව කලබල නොකළේ ය. ඔහු ඇති දැඩි කිරීම පහසු විය. සතුට, ප්‍රීතිය, වාසනාව සහ ශාන්තිය ඔහු පවුලට රැගෙන ආවේ ය.

හදිස්සිකාර ශක්තිමත් දරුවා සියලු දේ වේලාසනින් අත්හදා බැලීමට පටන් ගත්තේ ය. මම ඔහුට බාධා නොකළෙමි. ඔලේග් ඇවිදීමට පටන් ගත් විගස, සෑම ළදරුවකු මෙන් ම පළමු පියවර තබත් ම පය පැකිළී බිම ඇද වැටුණි. එහෙත් මම ඔහු නගා සිටුවන්නට ඉදිරියට නොපැන්නෙමි. ඔහු ම සිය දෙපා මත ස්වාධීනව නැගී සිට ඉදිරියට පා තබපුවාවෙ...

කිසි ම දිනක අපි පුංචි පුතාට වෘකයන් ගැන හෝ වෙනයම් භයංකර සත්ත්වයකු ගැන හෝ කියා බිය පත් නොකළෙමු. ඉතින් ඔහු අහේතුක සංත්‍රාසය හඳුනා නොගත්තේ,තනිව නිවසේ නැවතී සිටීමට පවා කැමැත්තෙන් ඉදිරිපත් විය.

ඉඳහිට මම විහිළුවට මෙන් සෙල්ලම් බඩු රැගෙන ඒමට ඔහුව අඳුරු කාමරයට පිටත් කොට හැරියෙමි. ඔහු දැඩි ආත්ම විශ්වාසයකින් සහ චකිතයෙන් තොර නිර්භීත බවින් පුංචි පා තබමින් අඳුර කුටියට වැදී, බිම අතපතගා කෙසේ හෝ සෙල්ලම් බඩුව අතැතිව මා සොයා ආවේ ය.

ග්‍රීෂ්ම ඍතුවේ දී පුතු සමග මම තණ පිටි මත බොහෝ ඇවිද්දෙමි. දියපාර හරහා ඉරියේ කුඩා පාලමකි. ඉදින් මම මෙසේ කීවෙමි.

'ඔලේග්, යන්න '

මෙහොතකටවත් දෙනෙත් ඉවතට නොගනිමින් මම ඔහු පිටුපසින් පිය නැගුවෙමි. කුඩා සිහින් පාලම දියට ඉහළින් දෙපසට වැනුණේ ය. එහෙත් ඔලේග් ශාන්ත ව. වරක්වත් ආපසු හැරී නොබලමින් තනිව පා නැගුවේ ය.

දිනක් වනයේ දී නෙලාගත් බෙරි සහිත කුඩය අතින් ගත් ඔලේග් මග දිගට බිම බලමින් තවත් එක් බෙරි ගෙඩියක් දෙපා අසලින් සොයා ගන්නට වෑයම් කළේය. එක්වරම ඔහු යමක් දැක දුවන්නට වූයේ, පය පැකිළී බිම වැටුණේ ය. බෙරි ගෙඩි දසක විසිරිණි. කුඩය පෙරළී ගොස් මඩ වළකට වැටිණි.

මම කුඩය ගං දියෙන් සෝදා එයට බෙරි ගෙඩි අහුලා එකතු කොට ඔලේග් වෙතට ගෙන ආවෙමි.

'ගෙදර ගියාම තෙත කුඩය හිරුට තියන්න' යි මම ඔහුට පැවසුවෙමි.

නිවෙසේ දී ඔලේග් බොහෝ වේලාවක් තැන තැන ඇවිදිමින් කුඩය තබන්නට තැනක් සොයමින් කල්ගත කළේ ය. ඔහු විමතියට පත් වූයේ, එක්වර මා වෙත දිවැවින් හඬන්නට පටන් ගත්තේ ය.

'අනේ මං කොහොම ද ඒක හිරුට කියන්නේ? මං උස මදිනේ...'

ඉන් පසු ව මම හැමදාමත් පුතු සමග කතා කරන විට බස් වහර ගැන සැලකිලිමත් වූයෙමි.

ඔලේග්ට තවමත් අවුරුදු තුනක් සම්පූර්ණ නොවී ය. දිනක් ඔහු සීයා ගෙන් මෙසේ ඇසුවේය.

' ඇයි අම්මා මට තනියම උද්‍යානයට යන්න ඉඩ දෙන්නැත්තේ?'

'ඒ නුඹ තාම පුංචි නිසා නොවැ. උද්‍යානය දුරයි. එකපාරටම මංමුළා වෙන්න පුළුවනි.'

'අන්න හොඳයි, මං කැමතියි මංමුළා වෙන්න '

'හොඳයි කියමුකො බලන්න, මංමුළා වුණොත් මොකද කරන්නේ කියලා?,

"අපේ ගෙදර සොයනවා."යි ඔලේග් පිළිතුරු දුන්නේ ය.

"හොඳයි එහෙනම් යන්න, නුඹ ඔය තරම් නිර්භීතයෙක් නම්."

ඔලේග් සැණින් පිටවී ගියේ ය. එහෙත් ඔහු පිටුපසින් ඔහුට නොදැනෙන්නට සැහෙන පරතරයක් තබාගනිමින් සීයා පියනැගුවේ ඔහු කෙරේ නිතර සැලකිල්ලෙන් පසුවිය.

උද්‍යානයෙහි දරුවන් සමග ඔහු සෙල්ලම් කරමින් පැයක් පමණ කල් ගත කළේ ය. එහෙත් එක්වරම තමා තනිව බැව් වැටහී ගියෙන් ඔහු නිවෙස බලා දුවන්නට පටන් ගත්තේය. ඔහු දිව්වේ ය. දිව්වේය. එහෙත් නිවෙස කොහේවත් නැත. එවිට ඔහු නතර වී හඬන්නට වූවේ ය. එක්තරා කාන්තාවක් ඔහු වෙතට ළං විය.

"ඇයි නුඹ මේ අඬන්නේ නුඹ කාගෙද?"

"මං ටිකක් මංමුළා වෙලා." යි කඳුළු ගිලිමින් පුතු උත්තර දුන්නේ ය. " මගේ අම්මා ගේ නම යෙලේනා නිකොලායෙව්නා, ආත්තම්මා ගේ නම දෙරා වසිලියෙව්නා, සීයා ගේ නම ෆෙදෝසි ඕසිපොවිච, තාත්තා ගේ නම වසීලී ෆෙදොසියෙවිච්, එතකොට මගේ නම ඔලේග් කොෂෙවොයි."

"හා හා යමු ගෙදර මම කොෂෙවොයිලාව දන්නවා"යි කාන්තාව සිනා පාමින් කීවා ය.

එවිට සීයා සැඟව සිටි තැනින් එළියට ආවේ ය.

ඔලේග් හනික ඔහු වෙතට පැන්නේ ය.

"ඉතින් මොකෝ" මංමුළා වුණා ද? යි සීයා සිනාසෙමින් ඇසුවේ ය.

"මං ඉස්සෙල්ලා මංමුළා වුණා. ඊට පස්සේ සොයාගත්තා,"යි පුතා උත්තර දුන්නේ ය. "සීයේ ඔයා දැක්කා නේද? මමයි හොයාගත්තේ.